ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
අධ්‍යාපන පීඨය
අධ්‍යාපනවේදී නාට්‍ය හා රංගකලා/ ස්වභාවික විද්‍යා ගෞරව
උපාධි වැඩසටහන - 2023/2024
හයවන මට්ටම
අවසාන පරීක්ෂණය 2024
**STU6313- ළමා අයිතිවාසිකම්**
කාලය පැය තුනයි. (03)

---

දිනය - 2024.12.19 වේලාව - ප.ව.01.30 - ප.ව.04.30 දක්වා

---

01 වන කොටසේ සියලුම ප්‍රශ්නවලට ද, 02 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.

## <u>01 වන කොටස</u>

01. එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියේ දක්වා ඇති අයිතිවාසිකම් භාණ්ඩ හතර (04) නම්කර ඒවා කෙටියෙන් පැහැදිලි කරන්න.

02. "…. වෙන්කොට නොසැලකීමේ මූලධර්මය" යන පදය පැහැදිලි කරන්න.

03. එක්සත් ජාතීන්ගේ සම්මුතිය අනුමත කිරීමෙන් අනතුරුව ළමා අයිතිවාසිකම් තහවුරු කිරීමට ශ්‍රී ලංකා රජය විසින් ගන්නා ලද පියවර පහක් (05) ලැයිස්තු ගත කරන්න.

04. ළමා අපයෝජනය සිදුවිය හැකි ආකාර පහක් (05) නම් කර, ඒවා වලක්වා ගැනීමට යෝජනා තුනක් (03) කෙටියෙන් ඉදිරිපත් කරන්න.

05. "අපත්‍යිකරණය" යනු කුමක්ද? ඒ සඳහා සපුරා තිබිය යුතු නිර්ණායක තුනක් (03) සඳහන් කරන්න.

06. පාසල් විවේක කාලයේදී සිසුන්ගේ ආරක්ෂාව තහවුරු කිරීමට ගුරුවරුන් විසින් අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග තුනක් (03) සැකෙවින් විස්තර කරන්න.

07. යටත්විජිත සමයට පෙර ශ්‍රී ලංකාවේ ළමා අයිතීන් පිළිබඳ පැවති තත්ත්වය කෙටියෙන් විස්තර කරන්න.

08. ළමා අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතියෙහි දක්වා ඇති සහභාගිත්ව අයිතිය තහවුරු කිරීමට නාට්‍ය හා රංගකලා ගුරුවරයකු/ විද්‍යා ගුරුවරයෙකු ලෙස ඔබට ගතහැකි ක්‍රියාමාර්ග පහක් (05) සඳහන් කරන්න.

(ලකුණු 5x8=40)

## 02 වන කොටස

09. (i.) ළමයාගේ උපරිම යහපත පිළිබඳ මූලධර්මය යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද? (ලකුණු 03)

(ii.) ළමා අපයෝජනයක් සිදුවී ඇති යැයි සැක සහිත අවස්ථාවක ඉහත මූලධර්මයට අනුකූලව ගුරුවරුන් විසින් ක්‍රියාත්මක විය යුත්තේ කෙසේද? (ලකුණු07)

(iii.) ළමා අපයෝජන අවම කිරීම උදෙසා, සමාජය දැනුවත් කිරීමට නිර්මාණාත්මක ලෙස සමාජ මාධ්‍යය භාවිතා කළහැකි ආකාරය විස්තර කරන්න. (ලකුණු 10)

10. (i.) විශේෂ තත්ත්ව යටතේ සිටින දරුවන් යනු කවුරුන්ද යන්න උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 03)

(ii.) ඔවුන්ගේ අධ්‍යාපන අයිතිවාසිකම් තහවුරු කිරීමට රජය විසින් ගත යුතු ක්‍රියාමාර්ග අවම තුනක් **(03)** යෝජනා කරන්න. (ලකුණු 07)

(iii.) එම යෝජනා ක්‍රියාත්මක කිරීමේදී මුහුණ දිය හැකි අභියෝග ජය ගැනීමට ඔබ විසින් ඉදිරිපත් කරන උපාය මාර්ග කවරේද? (ලකුණු 10)

11. (i.) ළමා අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතියෙහි "සහභාගීත්ව අයිතිය" යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද? (ලකුණු 03)

(ii.) "සහභාගීත්ව අයිතිය ළමයාගේ තොරතුරු දැනගැනීමේ අයිතිය තහවුරු කරයි."

ළමයින්ව හානිකර හා නොමඟ යවන තොරතුරුවලින් ආරක්ෂා කර නිවැරදි හා ප්‍රයෝජනවත් තොරතුරු ලබා ගැනීමට ඔවුන්ට මඟ පෙන්වීමට ගුරුවරුන්ට කල හැකි දෑ අවම තුනක් **(03)** යෝජනා කරන්න.

(ලකුණු 07)

(iii.) ඔබ ළමා අයිතිවාසිකම් පිළිබඳ නාට්‍යයක් නිර්මාණය කරනවා යැයි සිතන්න.

ළමයින්ගේ සහභාගීත්ව අයිතිය තහවුරු කිරීම උදෙසා ඔබ විසින් යෝජනා කරන නාට්‍ය පිටපතේ නාට්‍යමය ගැටුම කෙබඳු විය යුතු දැයි කෙටියෙන් ලියා දක්වන්න. (ඔබේ පිළිතුරේ නාට්‍යයෝචිත අවස්ථාව සහ ඊට අදාළ චරිත ඇතුලත් විය යුතුයි.)

(ලකුණු 10)

12. (i.) දෙමව්පියන් විසින් දරුවන් හදා වඩා ගැනීමේ ශෛලීන් තුනක් **(03)** සඳහන් කරන්න. (ලකුණු 03)

(ii.) ඉහත සඳහන් කළ ශෛලීන් ළමයින්ගේ චර්යා සහ සමාජයීය සංවර්ධනයට බලපාන ආකාරය විස්තර කරන්න.

(ලකුණු 07)

(iii.) දරුවන්ගේ පූර්ණ සංවර්ධනය තහවුරු කිරීමට, දෙමව්පියන් විසින් කළයුතු/ නොකළයුතු කරුණු තුන බැගින් ගුරු දෙගුරු රැස්වීමකදී ඔබ දෙමව්පියන්ව දැනුවත් කරන ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 10)

13. (i.) "දරුණු හා අපවාදාත්මක දඬුවම් ක්‍රම දරුවන්ගේ අයිතිවාසිකම් උල්ලංඝනය කරන අතර, දිගු කාලීන කායික හා මානසික හානි සිදුකල හැක."

ඉහත වගන්තිය උදාහරණ සහිතව විමසන්න. (ලකුණු 10)

(ii.) ළමා අයිතිවාසිකම් සහ ඔවුන්ගේ චිත්තවේගීය යහපැවැත්මට හානි නොවන පරිදි දරුවන්ගේ අයහපත් චර්යා නිවැරදි කිරීමට භාවිත කළ හැකි විනය ක්‍රියාමාර්ග අවම පහක් **(05)** යෝජනා කර එම විනය ක්‍රියාමාර්ග දරුවන්ගේ පෞර්ෂය සංවර්ධනයට බලපාන ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 10)

14. (i.) "වර්ධනය" හා "සංවර්ධනය" යන පද නිර්වචනය කරන්න. (ලකුණු 04)

(ii.) සිසුන්ගේ වර්ධනය හා සංවර්ධනය සහතික කිරීමට ගුරුවරුන්ට කළ හැකි දෑ වර්ධනය හා සංවර්ධනය යන ක්ෂේත්‍ර වලට අදාලව උදාහරණ දක්වමින් විස්තර කරන්න.

(ලකුණු 06)

(iii.) එම යෝජනා ක්‍රියාත්මක කිරීමේදි ගුරුවරුන් මුහුණදෙන අභියෝග තුනක් **(03)** හඳුනාගෙන ඒවා මගහරවා ගැනීමට කළ හැකි දෑ යෝජනා කරන්න.

(ලකුණු 10)

-හිමිකම් ඇවිරිණි.-